# CandleAid Lanka

**(Government Approved Charity – Reg.No.GA 201)**
**21/4, Dharmaratne Avenue, Rawathawatte, Moratuwa 10400, Sri Lanka.**
**Tel: +94 11 2642526 / Fax: +94 11 2642139**
**Email: admin@candleaid.org Website : www.candleaid.org**


## අලුතෙන් සම්බන්ධ වන ඔබට මගෙන් කෙටි හැඳින්වීමක්!



මම ලියන ආරච්චිගේ රවිදු ලක්මාල්. මම ඇඹිලිපිටිය ප්‍රදේශයේ ජීවත් වන අතර මේ වන විට යාපනය විශ්ව විද්‍යාලයේ නීති ශිෂ්‍යයකු ලෙස අධ්‍යාපනය හදාරමින් සිටී. ඇත්තවශයෙන්ම කිවුවොත් මට අධ්‍යාපනය හැදෑරීමට තරම් ආර්ථික වත්කමක් තිබුනේ නෑ. එහෙම තත්වයක් මත සිටින විට තමයි මම් කැන්ඩ්ල් ඒයිඩ් ලංකා ආයතනයේ ශිෂ්‍යත්වයකට සුදුසුකම් ලැබුවේ. එම ආයතනය සමග මම ඉතා සුහදශීලීව කටයුතු කල අතර එම කාලය තුලදී එල්මෝ ජයවර්ධන මහතා විසින් මම මෙම පාඨමාලාවට ඇතුලත් කර ගන්නා ලදී. මම කුඩා කල සිටම සාමාන්‍ය පවුල් පරිසරයක ජීවත් වූන අතර මට ඉංග්‍රීසි භාෂාව කතා කිරීමට තරම් කෙනෙක් නොවීය. එකී තත්වය මත මට මගේ විශ්ව විද්‍යාල අධ්‍යාපනය පවා මහත් පීඩාකාරී කටයුත්තක් විය. නමුත් මෙම පාඨමාලාවට ඇතුලත් වීමත් සමග මට එම බය මාගෙන් තුරන් කර ගැනීමට හැකි විය.

මෙම පාඨමාලාව වට්ස්ඇප් තාක්ෂණය ඔස්සේ පවත්වාගෙන යන අතර කිසිම මුදල් අය කිරීමකින් තොරව මෙය සිදු කරනු ලබන්නේ අප වගේ අසරණ අයගේ අනාගත සුභසිද්ධිය සඳහා ය. සෑම සතියකට වරක් ක්‍රියාකාරකම් ලබාදෙන අතර ඒවා කිරීමට අපොහොසත් වන අය එදිනම මෙම පාඨමාලාවෙන ඉවත් කරනු ලබයි. එමෙන්ම ඉංග්‍රීසි හොඳීන් දන්නා විවිධ පුද්ගලයන් සමග දුරකතන මාර්ගය ඔස්සේ කතා කිරීමට සලස්වන අතර එය බියකින් තොරව ඉංග්‍රීසි භාෂාව හැසිරවීමට මට මහත් රුකුලක් විය. ඒ වගේම අප හට ඉංග්‍රීසි නවකතාවක් ලබා දෙන අතර අපි සෑම සතියකටම පිටු පහ බැගින් කියවිය යුතු අතර සෑම සතියකටම වරක් අලුත් ඉංග්‍රීසි වචන 25 සෙවිය යුතුය. එමගින් අපගේ ඉංග්‍රීසි වචන මාලාව ඉතා හොදින් වර්ධනය කර ගැනීමට හැකි විය.

එල්මෝ ජයවර්ධන මහතා ඉතාමත් කාරුණික වූවද ඔහු දැඩි ප්‍රතිපත්ති අනුගමනය කරයි. පෞද්ගලිකව මම එතුමාගේ එම ප්‍රතිපත්ති වලට ගරු කරන අතර සමහර විට බියකින් මෙන්ම ගෞරවයකින්ද කටයුතු කරමි. ඇත්තවශයෙන්ම කිවුවොත් මම ඕනෑ තරම් ඔන්ලයින් හෝ ෆිසිකල් ඉංග්‍රීසි පාඨමාලාවන් වලට සහභාගී වී ඇති නමුත් එම කිසිම තැනකින් මට මාගේ ඉංග්‍රීසි දියුණු කර ගැනීමට නොහැකි විය. නමුත් කිසිම දේශනයක්වත් සිදු නොකරන මෙම පාඨමාලාව මාස තුනක පමන කාලයක් පවත්වන අතර මෙය ඉතාමත් සාර්ථක පාඨමාලාවකි. මන්ද යත් මෙම පාඨමාලාවට ඇතුලු වීමට පෙර මා හට ඉංග්‍රීසි භාෂාව කතා කිරීමට නොහැකි විය. නමුත් මේ වන මිට මා විසින් මෙම පාඨමාලාව නිම කර ඇති අතර මම බියකින් තොරව දැන් ඉංග්‍රීසි භාෂාව හසුරුවමි. ප්‍රාතිහාර්ය පාන්න පුලුවන් තැනක් පෙන්නන්න කිවුවොත් මට මෙම පාඨමාලාව පෙන්වන්න පුලුවන්.

***“It is better by far to light a solitary candle than to curse the darkness"***

# CandleAid Lanka

**(Government Approved Charity – Reg.No.GA 201)**
**21/4, Dharmaratne Avenue, Rawathawatte, Moratuwa 10400, Sri Lanka.**
**Tel: +94 11 2642526 / Fax: +94 11 2642139**
**Email: admin@candleaid.org Website : www.candleaid.org**


කෙසේ වෙතත් ඕනෑම තැනකදි ඕනෑම දෙයක් කිරීමට යාමෙදී අපට අප ගැන ආත්ම විශ්වාසයක් තිබිය යුතුය. ඒ වගේම උනන්දුවක්, කැපවීමක් තිබිය යුතුය. අප ගාව ඒ කිසිවක් නොමැති වූවහොත් ඉහත කී ආකාරයට ඔවුන්ට එම ප්‍රාතිහාර්ය පාන්නට නොහැකීවෙනු ඇත. නමුත් මහන්සි වී උනන්දු වන පුද්ගලයකුට ඉංග්‍රීසි භාෂාව හැදෑරීමට හොඳම තෝතැන්න මෙම පාඨමාලාව කියලා මට ආඩම්බරයෙන් කියන්න පුලුවන්. අවසාන වශයෙන් එල්මෝ ජයවර්ධන මහතාටත් කැන්ඩ්ල් ඒයිඩ් ආයතනයටත් හදපිරි ස්තූතිය පුද කරනවා දහසක් දූ දරුවන්ගේ ඇස් පාදන්න දරන මේ වැයමට.

**රවිදු ලක්මාල්**

18.12.2023

076 7624488




*“It is better by far to light a solitary candle than to curse the darkness"*